ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2019
----------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියාකර ඇති බව,

- මධ්‍යස්ථානය සිය බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික තොග සමීක්ෂණයේදි හඳුනාගත් පිරිවැය රු.1,652,924 ක් වූ යල්පැන ගිය විනාශ කල යුතු භාණ්ඩ හා හඳුනාගත් භාණ්ඩ ඌණතාවයන් හා අස්ථානගත වූ භාණ්ඩ සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | යල් පැන ගිය විනාශ කළ යුතු හා හඳුනාගත් භාණ්ඩ ඌණතාවයන් හා අස්ථානගත වූ භාණ්ඩ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතනයට එරෙහිව මෝටර් වාහන සැපයුම්කරුවෙක් විසින් රු.මිලියන 15 ක් අයකර ගැනිමට නඩු පවරා තිබුණි. ඊට අමතරව තවත් බාහිර පාර්ශවයන් 07 ක් ද ආයතනයට එරෙහිව වන්දි ඉල්ලා නඩු පවරා තිබුණු නමුත් මෙකී වගකීම් සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 15 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු අයවැය ගත හා සත්‍ය වටිනාකම් සන්සන්දනය කිරීමේ ප්‍රකාශය සහ ඊට ආදල මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ ඉදිරිපත් කළ යුතු හෙළිදරව් කිරීම් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 06 හි දක්වා ඇත. එහිදී ආයතනයේ ප්‍රගතිය අයවැය ගත දත්තයන්ට හා සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් හට වඩාත් පහසුවෙන් අවබෝධ වන ආකාරයට එය ඉදිරිපත් කරන ලදී. නමුත් මෙම වෙනස සැසදීමේ තීරුව අත්‍යාවශ්‍ය නොවන බව ප්‍රමිතයෙහිද දක්වා ඇත. | - එම - |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව සේවක පිරිවැටුප, ආබාධිත හා කලින් විශ්‍රාම ගැනිම්, වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩි වීම් හා ප්‍රතිලාභ ආදී ආයුගණක උපකල්පන පදනම් කරගෙන අයුගණක තක්සේරු ක්‍රමය (Actuarial valuation method) අනුව සේවක ප්‍රතිලාභ ගණනය කර ප්‍රතිපාදන වෙන් කළ යුතු වුවද ආයතනය විසින් සමාන්‍ය නෛතික විධිවිධාන පදනම් කරගෙන රු. මිලියන 39 ක ප්‍රතිපාදනයක් පමණක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය පියවරගැනීමට කටයුතු කරනු ඇත. | - එම - |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 237 | ඇස්තමේන්තු ගත වටිනාකම රු.71,750,056 ක් වූ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 14 ක වැඩ නිම කළ බවට විධිමත් වැඩ අවසන් කිරීමේ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතීන් සඳහා වන වැඩ අවසන් කිරීමේ වාර්ථා ව්‍යාපෘති 13 ක් සඳහා ලැබී ඇති අතර ඉතිරි ව්‍යාපෘතීන් හි ගෙවීම නිමා කොට නොමැති බැවින් අවසන් වාර්තා ලැබී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වැඩ නිම කිරීමේ වාර්තා ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 751 | සියළුම භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි ගණන් තැබිය යුතු වුවද මධ්‍යස්ථානය විසින් ලැබීම් හා නිකුත් කිරීම් එම අවස්ථාවන්හිදිම පොත්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම තත්ත්වයට ඉදිරියේදී ඇති වීම වැලැක්වීමට ගබඩා භාරකුරුවන්ගේ කාර්යයන් තවදුරටත් වෙන් කර වෙනත් කළමනාකරණ සහකරුවෙකුට පවරා ඇත. මින් ඉදිරියට අවම වශයෙන් මාස 02 කට වරක්වත් ලේඛන වල නිවරද්‍යතාවය සහ භාණ්ඩ සුරක්ෂිතාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ .පොත් පත් යාවත්කාලීන කිරීමේ කාර්යයන්ද නිවැරදිව සිදු කිරීමට අවශ්‍ය ඉදිරි පියවර මේ වන විටත් සිදුකර ඇත. | මුදල් රෙගුලාසි වල සඳහන් විධි විධාන අනුගමනය කිරිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 752 | බඩු ලේඛන පොතෙහි සැම සටහනක්ම බඩු ලේඛන වවුචරයකින් තහවුරු විය යුතු වුවද ගබඩා පොත් වල භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් සටහන් කිරීමේදි ඊට අදාල භාණ්ඩ ලැබීම් පත් හා නිකුත් කිරීම් පත්වල අංක තොග පොතෙහි සටහන් කිරිමට කටයුතු කර නොතිබුණි. එසේම ලැබීම් හා නිකුත් කිරීම් යන දෙවර්ගයේම බඩු ලේඛන වවුචර් වලට අනුපිළිවෙලින් අංක යොදා ඒවා ගොනුකර තැබිය යුතු වුවද මධ්‍යස්ථානයේ භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීමේ පත් අනුක්‍රමික අංක පිළිවෙලක් නොමැතිව නිකුත් කර ගොනුගත කර තිබු බව නිරීක්ෂණය විය. | බොහෝ අවස්ථා වලදී අදාල භාණ්ඩ ලැබීම් සහ නිකුත් කිරීම් පත් වල අංක තොග පොතෙහි සටහන් කිරීම අතපසු කර ඇති බවට එකඟ වෙමිලැබීම් හා . නිකුත් කිරීම් පත්‍ර පරිගණක පද්ධතියක් මගින් සිදු කරන බැවින් අනුක්‍රමික අංක පිළිවෙලින් නිකුත් කරනු ලැබේ . කිසිවිටෙකත් ද්විගණන දෝෂයක් සිදුවිය නොහැක.තවද ගබඩාභාරකරු විසින් දෛනිකව තොග පොත් වල සටහන් පරිගණක පද්ධතිය සමඟ සංසන්දනාත්මකව පවත්වාගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි වල සඳහන් විධි විධාන අනුගමනය කිරිමට කටයුතු කළ යුතුය. |
| (iv) මුදල් රෙගුලාසි 754 | සෑම මුදල් වර්ෂයකම අවසානයේදි බඩු ලේඛන පොත තුලනය කර "අතැති ශේෂය" ඊලඟ මුදල් වර්ෂයට ඉදිරියට ගෙන යා යුතු වුවද මධ්‍යස්ථානයේ ගබඩා පොත් 2018 වර්ෂයෙන් පසු එසේ තුලනය කර ශේෂ ඉදිරියට ගෙන ගොස් නොතිබුණි. | මෙම තත්ත්වය වලක්වා ගැනීමට කාර්යභාරයන් වෙනත් සේවකයෙකුට පවරා ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි වල සඳහන් විධි විධාන අනුගමනය කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) අංක 01/2012 හා 2012 ජනවාරි 05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය | කොන්ත්‍රාත් පැවම සඳහා ප්‍රජාපාදක සංවිධාන තෝරාගැනීමේ කමිටු සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නම් කළ නියෝජිතයෙකු ඇතුලත් විය යුතු නමුත් එවැනි නියෝජිතයන් පත්කර නොතිබුණි. | මේ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කොට ඇති බව දන්වා සිටිමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කමිටු සඳහා නියෝජිතයින් පත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) අංක 6/97 දරණ 1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (VI) ඡේදයේ | අතිකාල වැඩ පැවරීම සම්බන්ධයෙන් තමන් කරන ලද නිර්දේශයන් සෑම මාස 03 කට වරක්ම ආයතන ප්‍රධානියා විසින් සමාලෝචනය කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | ආයතන ප්‍රධානියා විසින් අනුමත කර ඇති කාල චක්‍රයට අනුව මාසිකව සේවකයින් සේවයේ යොදවා ඇත. මෙම සේවා රටාව වසර පුරාවට ආයතනයේ ක්‍රියාත්මක වන බැවින් එබැවින් මාස 03කට වරක් සමාලෝචනය කිරීම සිදු නොවේ. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) අංක 19 /89 හා 1989 මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය | ඡේදයේ සඳහන් උප වගන්ති වල දැක්වෙන තොරතුරු පරිදි අතිකාල වැඩ සඳහා ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් චක්‍රලේඛය ප්‍රකාරව ලේඛනයක් පවත්වා නොතිබුණි. | අතිකාල ලේඛණයක් 2019 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලැබේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ලේඛනය යාවත්කාලීන කිරීමට සටහන් කරගෙන ඇත. | - එම - |
| (ඉ) අංක 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.7 ඡේදය | බහුවිධ අවදානම් සිතියම් ගත කිරීම සඳහා දත්ත සකස් කිරීම වෙනුවෙන් දීමනා ලෙස රු.3,428,400 ගෙවීම් කර තිබුණ ද ඒ සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | බහුවිධ ආපදා පැතිකඩ සැකසීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාවේ දත්ත සැකසීම එක් කාර්යයක් ලෙස හඳුනාගෙන තිබූ බැවින් වෙන්ව අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කොට නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. | ගෙවීම් සිදු කිරීමට පෙර අදාල අනුමැතිය ලබා ගැනිමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 65.03 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 33.32 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 31.71 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රදාන සහ අනෙකුත් ආදායම් පහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සංශෝධන කටයුතු 2008 වර්ෂයේ සිට සිදු කර තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන තෙක් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධන කටයුතු ආපදා කළමනාකරණ අංශය විසින් සිදුකරනු ලබයි. | පනතෙහි සංශෝධන සිදු කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාත්‍යන්තර අවශ්‍යතාවයක් වන සෙන්ඩායි රාමුව අනුව ආපදා අවදානම අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී මධ්‍යස්ථානයට රුපියල් මිලියන 1.30 ක ලබා දී තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එසේම 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ජේදයේ 2 (අ) පරිදි 2018 - 2030 කාල පරිච්ජේදය වෙනුවෙන් ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2017 වර්ෂයේදී රුපියල් මිලියන 02 ක් මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අදාල කාර්යය අවසන් කර නොතිබුණි. | ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සංශෝධනයන් සිදුකල යුතු බව අමාත්‍යාංශය තීරණය කරන ලදි. ඒ අනුව විවිධ පාර්ශවයන්ගේ අදහස් ලබාගෙන කෙටුම්පත සකස් කර සංශෝධනය කරමින් පවතී. ඉතිරි මාස 3ක ඇතුළත අනුමැතිය සඳහා යොමු කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | ජාතික ආපදා කළමණාකරණ සැලැස්ම හැකි ඉක්මනින් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මොනරාගල දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික වගා ළිං ඉදි කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 26.9 ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද දිස්ත්‍රික් ලේකම්ගේ මාර්ගෝපදේශ අනුව කටයුතු නොකිරීම නිසා රුපියල් මිලියන 10.5 ක් 2019 දෙසැම්බර් 10 | ළිං තෝරා ගැනීම දිස්ත්‍රික් ලේකම් අධීක්ෂණයෙන් දිස්ත්‍රික් සහකාර අධ්‍යාක්ෂකගේ සම්බන්ධීකරණයෙන් සිදුකරන ලද බැවින් ඒ පිළිබඳව දිස්ත්‍රික් | මාර්ගෝපදේශ අනුව ක්‍රියා කරන බවට මධ්‍යස්ථානය තහවුරු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| දින අමාත්‍යාංශය වෙත නැවත පවරාගෙන තිබුණි. එසේම ප්‍රතිලාභීන් 53 වෙනුවෙන් වගා ළිං සැකසීම සඳහා රුපියල් මිලියන 26.5 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවය ඇගයීමකින් තොරව මුදල් වැයකර තිබීම හේතුවෙන් අවශ්‍යතාවයක් නොමැති ළිං 24 ක් තැනීම සඳහා වැය කළ රු.මිලියන 12 ක නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | ලේකම්ගෙන් කරන ලද වීමසීමේදී දිස්ත්‍රික් ලේකම් විසින් භාවිතා කරන ලද මාර්ගෝපදේශය මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කොට ඇත. දිස්ත්‍රික් ලේකම් මධ්‍යස්ථානයට ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශය ළිං තෝරා ගැනිම සඳහා භාවිතා කොට ඇත. | |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මගින් විවිධ වැඩ සටහන් 05ක් වෙනුවෙන් ලැබී තිබුණු රුපියල් මිලියන 3.56 ක මුදලක් සහ සාර්ක් සංවිධානය මගින් අත්තිකාරම් වශයෙන් 2015 වර්ෂයේ ලබාදී තිබුණු රුපියල් මිලියන 1.75 ක් හා විවිධ සංවිධාන හා ආයතන විසින් ලබාදෙන ලද අරමුදල් රු.772,000 ක් අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. එසේම, ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් අමාත්‍යාංශය මගින් නගර 10 ක් සඳහා ආපදා අවදානම් සිතියම් සැකසිම සඳහා ලබා දුන් රුපියල් මිලියන 2 ක් හා ලෝක ආහාර වැඩසටහන මගින් ලබාදුන් රුපියල් මිලියන 2 ක මුදල් ප්‍රයෝජනයට නොගෙන ආපසු යවා තිබුණි. | සාර්ක් සංවිධානයේ, සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ශ්‍රී ලංකාව තුලින් සාර්ක් සංවිධානයේ රටවල් හා ආසියානු කලාපීය රටවල සහභාගිත්වයෙන් ආපදා අවදානම් අවම කිරීම සඳහා සමුළුවක් පැවැත්වීම සඳහා අත්තිකාරම් මුදල් ලබා දී ඇත. එහි දී මූලික ක්‍රියාවලිය ආරම්භ කොට ක්‍රියාත්මක කරන අතරතුර සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රතිව්‍යුගත කරන ලද අතර මේ වන තුරු ප්‍රතිව්‍යුහගත කරන ලද සාර්ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කලාපීය සහයෝගිතා ගිවිසුම අනුව ස්ථාපිත කොට නැත. එබැවින් මෙම මුදල් පිළිබඳව ස්ථිර තීරණයක් ගැනීමට නොහැකි වී ඇත. ආපදා අවදානම් අවම කිරීමේ උපදේශන මාලා සකස් කිරීමෙන් පසු එහි ඉතිරි ක්‍රියාකාරකම් සඳහා ඉතිරි පළාත් මට්ටමේ ආපදා අවදානම් අවම කිරීම සඳහා ලබාදුන් රු. 1,000,000 | අරමුදල් අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කිරිමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | මුදල වැය කිරීමට සැලසුම් කර තිබුණ ද ආපදා අවදානම් අවම කිරීමේ උපදේශන මාලා සකස් කිරීමට අදාලව පරීක්ෂණ ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා මෙම මුදල වැය කිරීමට නොහැකි වී ඇත. | |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආපදා අවදානම් අවම කිරීම් සංවර්ධන ප්‍රවාහය ඇතුලත් කිරිම සඳහා මාර්ගෝපදේශ සකස් කිරිමට උපදේශන සේවා ආයතනයක් තෝරා ගැනීම සඳහා වු ප්‍රසම්පාදන කමිටුව උපදේශකගේ තෝරා ගැනීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.3 ජේදයට අනුව අමාත්‍යාංශ ලේකම් විසින් පත් කර නොතිබුණු අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ජේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරිමට පෙර ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6.4 ජේදය ප්‍රකාරව එකඟ වු වටිනාකමින් සියයට 20 ක් පමණක් අත්තිකාරම් වශයෙන් ගෙවිය හැකි වුවද එකඟ වූ වටිනාකමින් සියයට 30 ක් එනම් රු.1,927,500 ක් අත්තිකාරම් ඇපකරයක් රහිතව ගෙවා තිබුණි. මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6.1 ජේදයට අනුව ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර එකඟ වු කාලය තුල කාර්යය නිමකරද නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කිරීමට අමාත්‍යාංශයේ ලේකම් විසින් කමිටුවක් පත්කළ අතර එම කමිටු වාර්තාව ලැබීමට නියමිතව ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවට බලපා ඇති බහුවිධ ආපදා තොරතුරු ඇතුලත් කරමින් අවදානම් දර්ශක පොතක් මුද්‍රණය කිරීම වෙනුවෙන් පැහැදිලිව හඳුනාගත් අවශ්‍යතාවයක් හා අරමුණක් නොමැතිව හා බෙදාහැරිය යුතු ආයතන පිළිබඳ පූර්ව සැළසුමක්ද නොමැතිව රු. 1,850,000 ක් වැය කර පොත් 100 ක් මුද්‍රණය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | මෙම පොත් ප්‍රධාන ගඩබාව විසින් අවශ්‍යතාවය අනුව සෘජුවම බෙදාහැරීම සිදු නොකිරීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇති අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බව | මාර්ගෝපදේශ පිලිපැදීම හා ඉල්ලුම් කළ පිරිවිතර වලට අනුගතව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංග්‍රහයේ 2.6.1(අ)(II) අනුව පිරිවිතර සමාලෝචනය හා අනුමත කිරීම සිදුවී නොතිබුණු අතර මිල ගණන් ඉදිරිපත් කිරීමට ලබාදුන් පිරිවිතර වලට පටහැනිව පොත් මුද්‍රණය කර තිබුණි. | | |
| (ඇ) | ඊසාන දිග මෝසම් වර්ෂාවේ බලපෑම නිසා ඇති විය හැකි ආපදා තත්වයන් මැඩ පැවැත්විම සඳහා වන පොලිසැක් උරවල අවශ්‍යතාවය දිස්ත්‍රික් කාර්යාල මගින් 2019 වර්ෂයේ දන්වා තිබුණද මධ්‍යස්ථානය විසින් අදාල මිලදි ගැනීම් සැලසුම් නොකිරිම නිසා හදිසි මිලට ගැනිම මගින් අදාල මළු සම්පාදනය කර ගැනීමට සිදුව තිබුණි. මේ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ පිරිවිතර වලට අනුකූල නොවන ලෙස එක් දිනයකින් භාණ්ඩ මිලට ගැනිම සඳහා රු.1,200,000 ක් වැය කර තිබු අතර එයින් පොලිසැග් උර 500 ක් මධ්‍යස්ථානයේ මුල්‍ය හා මානව සම්පත් අංශය භාවිතයට ගෙන තිබුණි. | 50KG පොලිසැක් වෙනුවෙන් එක් ආයතනයකින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරන විටත් බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ වැව් බැමි කඩාගෙන යාමේ අවදානම පැවතීම හේතුවෙන්, 50KG පොලිසැක් උර මිලදී ගැනීම සඳහා අවම වශයෙන් ආයතන විසින් ලංසු තුනක් ඉදිරිපත් කර නොතිබිම සළකා බලා, 25KG පොලිසැක් උර මිලදී ගැනීම සලකා බැලීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර ඇත.<br>තවද, ජලය සහිත තෙත 50KG වැලි කොට්ට එක් පුද්ගලයෙකුට තනිව ඔසවාගෙන ගෙන යාමට අපහසු වීම නිසා 25KG උර මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කර තිබේ.<br>දිස්ත්‍රික්ක කිහිපයකට සහ ශ්‍රී ලංකා යුද හමුදාවට පොලිසැක් උර බෙදා ඇති අතර පොලිසැක් උර 500ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය බැහැර කරලීමට භාවිතා කරන ලදී. | තාක්ෂණික ඇගයීම් කමිටු පිරිවිතර වලට අනුකූලව මිලදි ගැනිම් සිදු කළ යුතුය. |
| (ඈ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල ආපදා කළමණාකරන ව්‍යාපෘති 67 ක් ක්‍රියාත්මක කිරිම සඳහා මධ්‍යස්ථානය විසින් රුපියල් මිලියන 68.3 ක් තුන්වන පාර්ශවයක් වෙත මුදාහැර තිබුණ නමුත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක | ගොනුවල අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | ව්‍යාපෘති වලට අදාල ලිපිගොනු විධිමත්ව පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

කිරීමට ආදාල ගිවිසුම්, ව්‍යාපෘති සඳහා පිළියෙල කළ අනුමත ඇස්තමේන්තු, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ පසුවිපරම් කටයුතු සිදු කිරීමට වගකිව යුතු පාර්ශව පිලිබඳ විස්තර, කොන්ත්‍රාත්කරුවන් සමග එලඹි ගිවිසුම්වල පිටපත් සහ ප්‍රගති වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානය විසින් 2014 සිට 2017 දක්වා වාර්ෂික වාර්තා 2019 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවට සභාගත කර නොතිබුණි. | 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | වාර්ෂික වාර්තා චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව සභාගත කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 4.2 නොවිසඳුනු නීතිමය ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.මිලියන 1034.39 ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2010 වර්ෂයේදී ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත නිත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි. | මෙම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමේ කටයුතු පිළිබඳ සොයා බලා ඉදිරියේ දි අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. | අදාල ඉඩම හා ගොඩනැගිල්ල නිත්‍යානුකූලව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

**4.3 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟා වීමේ ප්‍රගතිය වාර්තා කර නොමැත. | ඉදිරියේදී ලබාදී ඇති උපදෙස් අනුව ක්‍රියාකරන බව දන්වා සිටිමි. | තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 වන දිනට මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 465 වුවද සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 316 ක් වූ අතර කාර්ය මණ්ඩලය 149 ක පුරප්පාඩු පැවතුණි. | අදහස් දක්වා නොමැත | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |